www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප කීර්ති බාලසූරියගේ අභාවයේ 20 වන සංවත්සරය සමරයි

## Sri Lankan SEP marks 20th anniversary of Keerthi Balasuriya's death

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2007 දෙසැම්බර් 20**

කීර්ති බාලසූරියගේ අභාවයේ 20 වන සංවත්සරය සමරනු වස් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) දෙසැම්බර් 18 දා ඔහුගේ සොහොන අභියස කෙටි උත්සවයක් පැවැත්වී ය. කීර්ති බාලසූරිය සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ආරම්භක ප්‍රධාන ලේකම් විය. ඔහු 1987 දී දරුනු හෘදයාබාධයක් වැලඳී මිය ගියේ විකොස කාර්යාලයේ වැඩ කරමින් සිටිය දී ය. එවිට ඔහු යන්තම් 39 වන වියට එළඹ සිටියා පමනි.

කීර්ති සහෝදරයාගේ දිගු කාලීන දේශපාලන සහකරුවන් ඇතුලු සසප ප්‍රමුඛ සාමාජිකයන්, කොළඹ හා ඒ අවට පක්ෂ ආධාරකරුවන් සහ කීර්තිගේ පවුලේ සාමාජිකයෝ කොළඹ කනත්තට රැස්ව සිටියහ. විකොස ආරම්භක සාමාජිකයකු ද වූ සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් පුෂ්පෝපහාරයක් පවත්වා ඕස්ට්‍රේලියාවේ සසප ජාතික ලේකම් නික් බීම්ස් විසින් එවන ලද අනුස්මරන පනිවිඩයක් කියවී ය. එහි මෙසේ සඳහන් විය:

"කීර්ති සහෝදරයාගේ අභාවයෙන් පසුව වසර 20ක් ගතව ඇතැයි විශ්වාස කිරීම පවා අසීරු ය. ඔහුගේ වියොව සියල්ලට ම වඩා දැනෙන්නේ, ඔහු කවිප පරිහානිය මගින් නිර්මානය කෙරුනු සියලු දුෂ්කරතා මධ්‍යයේ සටන් වැද ඒ හරහා තමන් ම නැගී සිටීමට එළඹ සිටි අවස්ථාවක එය සිදු වූ බව අප දන්නා හෙයිනි. එහෙත් ඔහු සමග වැඩ කිරීමේ ගෞරවය හා වරප්‍රසාදය ලැබූ අපට ඔහු ඉතිරි කර තබා ගිය දේශපාලන අරගලයේ හා න්‍යායික අවබෝධයට දැක්වූ අවධානයේ උරුමයෙන් තවමත් බොහෝ පාඩම් උකහා ගත හැකි ය. එම උරුමයේ අර්ථභාරය පිලිබඳව මීට වසර 20කට පෙර අප පැවසූ දෙය අද පවා සත්‍ය ය. ශ්‍රී ලංකාව තුල හා ජාත්‍යන්තරව එළඹීමට නියමිත නැගිටීම් තුල දී අපි එම උරුමය මත පාදක විය යුත්තෙමු.

"අපගේ ජාත්‍යන්තර ව්‍යාපාරයේ අගනාම සටන්කරුවන්ගෙන් කෙනෙකු මතක් කරන අද දින විලානි සහෝදරියට හා ශ්‍රී ලංකාවේ අපගේ සියලු සහෝදරවරුන්ට කරුනාකර අපගේ ගැඹුරුතම හා උනුසුම්ම සුභපැතුම් ඉදිරිපත් කරන්න."

කීර්තිගේ අභාවයේ 20 වන සංවත්සරය සැමරීම පිනිස ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති හා එක්සත් ජනපදයේ සසප ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත කොටස් දෙකකින් යුත් ලිපියෙන් ද ඩයස් උපුටා දැක්වී ය.

ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ බුෂ් ආන්ඩුව ගෙන යන යුද්ධ මෙන් ම ඉරානයට එරෙහි එහි මිලිටරි සූදානම් ද මගින් අධිරාජ්‍යවාදී ආක්‍රමනික වැඩකටයුතු උත්සන්න කෙරී ඇති බව ඩයස් පෙන්වා දුන්නේ ය. යුදවාදයට හා ගැඹුරු වන සමාජ අසමානතාවට එරෙහිව කම්කරුවන්ගේ හා තරුනයන්ගේ පෙරලිකාරීත්වයක් වර්ධනය වෙමින් තිබේ. ශ්‍රී ලංකාව හා දකුනු ආසියාව තුල තත්වය මෙම ජාත්‍යන්තර ක්‍රියාදාමයෙන් වෙන් කල නොහැකි ය.

"කීර්ති බාලසූරිය සහෝදරයා 1987 දි අභාවයට පත් වන වකවානුව වන විට මේ රටේ සිවිල් යුද්ධය සම්බන්ධයෙන් පැවතිච්චි මනෝගතිය නෙවෙයි වැඩ කරන ජනතාවන් හා පීඩිත ජනතාවන් අතරෙ අද පවතින්නෙ. එදා වර්ගෝත්තමවාදය ඉහල නැංවුනු තත්වයක් පැවතුනේ. ඒ එක්කම ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) කම්කරු පන්තියේ ඔලුවලට ඔවුන්ගේ තුවක්කු එල්ල කර ගෙන ප්‍රහාර එල්ල කරන වකවානුවක් ඒ අවධියේ දී පැවතුනේ." යැයි ඔහු පැවසී ය.

වැඩ කරන ජනතාව හා තරුනයන් යුද්ධයට විරුද්ධව සමාජවාදී වැඩපිලිවෙලක් මත බලුමුලුගැන්වීම සඳහා පක්ෂය ඉදිරියේ නව අවස්ථාවන් විවෘත වෙමින් පවතී. මෙම දේශපාලන අවස්ථාවන් ග්‍රහනය කර ගැනීම පිනිස කීර්ති විසින් කරන ලද දේශපාලන හා න්‍යායික ප්‍රතිපදානයන් උකහා ගැනීම අත්‍යවශ්‍ය බව ඩයස් කියා සිටියේ ය.

සසප දේශපාලන කමිටු සාමාජික විලානි පීරිස් රැස්ව සිටි පිරිස අමතා මෙසේ පැවසුවා ය: "කීර්ති 1966 දී ශිෂ්‍යයෙක් හැටියට දේශපාලන ජීවිතය ආරම්භ කරන කොට ඔහුට පොර බදන්ට සිද්ධ වුනු දේශපාලන ප්‍රශ්න අතිශයින් විශාලයි. 1964 වෙන කොට, ලංකා සමසමාජ පක්ෂය (ලසසප) පැබ්ලෝවාදය යටතේ ශ්‍රී ලංකා නිදහස්

පක්ෂය (ශ්‍රීලනිප) නායකත්වය දෙන ධනේශ්වර සභාගයකට ඇතුලුවීම මගින් මුලුමනින් ම ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ගය පාවාදීලයි හිටියෙ. එබඳු කොන්දේසි යටතේ තරුන කන්ඩායමකට ස්පයික් (දිගු කාලීන ට්‍රොට්ස්කිවාදියකු වූ විල්ෆ්‍රඩ් පෙරෙයිරා) සහෝදරයා සමග ඒකාබද්ධව ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අරගලය පොර බදන්න සිද්ධ වුනා.

" කීර්ති ට්‍රොට්ස්කිවාදී මූලධර්වලට දැඩි ලෙස කැප වී ගෙන අවස්ථාවාදයට හා සංශෝධනවාදයට විරුද්ධව සම්මුති විරහිත අරගලයක් ගෙන ගියා. ඔහු මාක්ස්වාදී ව්‍යාපාරයේ සමස්ත අත්දැකීම් පක්ෂය තුලට ගෙන ආවා. එයින් අධ්‍යාපනය ලබපු සහෝදරසහෝදරියෝ හැටියටයි අද අපි පක්ෂය තුල සිටින්නෙ.

" කීර්ති සහෝදරයාගේ දේශපාලන හා න්‍යායික කෘතීන් ජාත්‍යන්තර කම්කරු පන්තිය වෙනුවෙන් පල කිරීමේ වැඩකටයුතු ඔහුගේ අභාවයේ 20 වන සංවත්සරය වෙනුවෙන් අප සූදානම් කරමින් සිටිනවා. . . . වසර 22ක සාපේක්ෂව කෙටි ජීවිත කාලය තුල දී කීර්ති සිදු කල ප්‍රතිපදානයන් අද කම්කරුවන් හා තරුනයන් විප්ලවවාදී වැඩපිලිවෙලක් මත උගන්වා ගැනීම සඳහා අතිශයින් වැදගත් වෙනවා."

කීර්ති බාලසූරියගේ අභාවයෙන් වසර 20ක් ගත වීම සමරනු වස් ඉරිදා පැවැත්වෙන ප්‍රසිද්ධ රැස්වීමට පැමිනෙන ලෙස සසප සිය ආධාකරුවන්ට හා පාඨකයන්ට ආරාධනා කර සිටී.

**වේලාව: දෙසැම්බර් 28 දා සවස 3.00ට**

**ස්ථානය: මහවැලි කේන්ද්‍රය, ග්‍රීන් පාත්, කොලඹ 7**

© www.wsws.org